ස්වදේශ කටයුතු චක්‍රලේඛ: 13/2019

මගේ අංකය : එච්ජීඑෆ්/1/02-වෙසක්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.
2020.05.04

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
සියළුම පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
සියළුම සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරුන් / දිසාපතිවරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්,

<u>රාජ්‍ය වෙසක් උත්සවය සැමරීම - 2020</u>

ශ්‍රී බුද්ධ වර්ෂ 2564 ක් වූ 2020 මැයි මස 07 හා 08 දෙදින වෙසක් පෝය දින වශයෙන් ප්‍රකාශයට පත් කර ඇති අතර, මෙවර වෙසක් උත්සවය වෙනුවෙන් **2020 මැයි මස 04 සිට 10 දක්වා වෙසක් සතිය** ලෙස රජය මඟින් ප්‍රකාශයට පත් කර ඇත.

02. එසේම **"ආරෝග්‍යා පරමාලාභා - සන්තුට්ඨී පරමං ධනං ( නීරෝගිකම පරම ලාභයයි- සතුට පරම ධනයයි")** යන තේමා පාඨය වෙසක් තේමා පාඨය ලෙස රජය විසින් තෝරා ගෙන ඇත.

03. එබැවින්, 2020 මැයි මස 04 දින සිට 10 දක්වා රජයේ සියළුම ගොඩනැගිලි වල බෞද්ධ කොඩිය ඔසවා තැබීමට හා එම ගොඩනැගිලි වෙසක් සැරසිලි වලින් අලංකාර කිරීමට ද තීරණය කර තිබේ.

04. ඒ අනුව, අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසත්, ඒ සම්බන්ධයෙන් ඔබ යටතේ ඇති සියලුම ආයතන දැනුවත් කරන ලෙසත් කාරුණිකව දන්වමි.

එස්.හෙට්ටිආරච්චි
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

පිටපත් :
1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්